**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ පිටපත් අමුණා ඇත. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |

| | | | | |
|---|---|---|---|---|
| | X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදි අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කෙරෙමින් පවති. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,684,918 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,798,273 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 56,000 | - | 1,701,418 | 967,734 | 60,000 | - | 40,448 | 958,126 |
| කුලී | 6,273,000 | - | 6,881,230 | 126,308 | 5,510,000 | - | 5,748,138 | 121,709 |
| බලපත්‍ර ගාස්තු | 6,582,000 | - | 4,949,503 | - | 6,290,000 | - | 6,526,972 | - |
| වෙනත් ආදායම් | 68,112,000 | - | 45,358,960 | - | 59,725,000 | - | 37,052,070 | - |
| එකතුව | **81,023,000** | **-** | **58,891,111** | **1,094,043** | **71,585,000** | - | **49,367,626** | **1,079,835** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.49,367,626 වුවත්, 2018 වර්ෂයේ රැස්කළ අදායම රු. 58,891,111ක් දක්වා වැඩි වීමෙන් 2017 වර්ෂයේ ආදායම 2018 වර්ෂය සමග සැසඳීමේදි ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.9,523,485කින් වැඩි වී තිබුණි. එසේ වුවත්, බිල්කළ ආදායම් තහවුරු කළ නොහැකි විය. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ හිඟ වරිපනම් බදු එකතුව රු.3,244,074 ක් පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 04ක අධික කාලයක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදි හිඟ වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ බදු රු.118,439ක් සම්බන්ධයෙන් අයකිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු කුලී සම්බන්ධයෙන් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | තොරතුරු ඇති අයට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විදුලි සංදේශ කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු. 50,000 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |

**2.2.6 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.4,112,162 ක් සහ මුද්දර ගාස්තු රු.6,844,143 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අරමුදල් ලැබීමේදී හිඟ මුදල් ලැබෙනු ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 06ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණි. | සියළුම කරුණු සඳහා අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමට කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 06 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) **මූලා ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් 20 කින් ක්‍රියාකාරකම් 06 ක් පමණක් වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබූ බැවින් රු.9,700,000 ක් වටිනා ක්‍රියාකාරකම් 14 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය. | සංවර්ධනය මූලා ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරී සැලැස්ම ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | කාර්යයන් 14ම සංවර්ධනය මූලා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර ඇත. |

(ඈ) **කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරකම් 09 ක් ආරම්භ කර තිබුණත් එම ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | අදාල ක්‍රියාකාරකම් අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල කාර්යයන් සඳහා පිළිගත හැකි හේතු සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදී ඇත. |

(ඉ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය ඉවත්කිරීම සඳහා රු. 121,945ක් වැය කර තිබුණත් ඝන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ කාර්යයන් ප්‍රා දේශීය සභාව විසින් ඵලදායි ආකාරයෙන් සිදු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය මඟින් ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණ මේ දක්වා සිදු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදි දිරන සහ නොදිරන ලෙස වර්ග නොකර රැස්කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන් කර රැස්කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙන් කර රැස්කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ඊ) පාරිසරික ගැටළු**

-----------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------------- | ----------------------------- |
| | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------------- | ----------------------------- |
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අදාල කාල පරිච්ඡේදය තුළ පරීක්ෂා කර නොතිබූ අතර ගොඩනැගිලි ඉදිකිරිම අනුමැතිය සඳහා ලේඛන විධිමත් අයුරින් පවත්වාගෙන නොතිබුණි. | අදාල කාලය තුළ ගොඩනැගිලි ඉදිකිරිම් අනුමැතිය ලබා දිය යුතුවේ. | අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) | මහජන සේවාවන් ලැයිස්තු ප්‍රදර්ශනය සඳහා තබා නොතිබුණි. | මහජන සේවාවන් ලැයිස්තු ප්‍රදර්ශනය සඳහා කටයුතු සැලසිය යුතු වේ. | අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව වෙත මහජනතාව සහ මහජන ආයතනවලින් ලැබෙන පැමිනිලි සම්බන්ධයෙන් නියමිත කාලයේ විසඳුම් ලබාදී නොතිබුණි. | පැමිනිලි සම්බන්ධයෙන් නියමිත පරිදි කඩිනමින් කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ඈ) | 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදවල ප්‍රජා මධ්‍යස්ථාන සහනාධාරවලින් රු.306,400ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන | ප්‍රජා මධ්‍යස්ථාන සහනාධාර මුළුමනින්ම ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සහනාධාර ලබාදීමට කටයුතු කරනු ලැබේ. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකරනු ලබන අයගේ තොරතුරු ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ලේඛනවල ඇතුළත් නොකර අයකිරීමේදි පමණක් ආදායම් ලෙස සලකා ගිණුම් තබන අතර ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ගණනය කර ලැබිය යුතු ප්‍රමාණය ලෙස මූල්‍ය ප්‍රකාශනවලට කිසිවක් ඇතුළත් නොකෙරේ. | ව්‍යාපාර බලපත්‍ර හිමියන් සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන යායුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඊ) | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | නියමිත වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 09 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ පවතින ඉඩම්, සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලි ආදියෙන්දේපළ බදු අයකර ගැනීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපළ හිමියන්ට "K" ආකෘති පත්‍ර ලබාදිය යුතුවේ. එනමුත් ප්‍රාදේශීය සභාව විසින් දේපළ සඳහා "K" ආකෘති පත්‍ර මහජනතාවට නිකුත් කර නොතිබුණි. | අදාල පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරිමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් අනවසර ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් වදනරුබන් මනෝරන්ජිදම් යන අයට එරෙහිව අංක 30283 දරන නඩුවේ කටයුතු 2016 වර්ෂයේ සිට කෙරීගෙන ගොස් තිබූ නමුත් මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. | නඩුව සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | ඉදිරි අනාගතයේ කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ බදු දී තිබූ ඉන්බරුට්ටි වෙරළාසන්න මාළු වෙළෙඳ සැල බදු රු.10,332ක් බදුකරුගෙන් වර්ෂ 08ක කාලයක සිට අයකර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් අංක 33109 දරන නඩුවේ කටයුතු 2018 වර්ෂයේ සිට කෙරීගෙන යන නමුත් මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. | නඩුව සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | ඉදිරි අනාගතයේ කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ බදුදී තිබූ මන්තිගෙයි වෙළෙඳ පොළ කුකුළු මස් කඩයේ බදු රු.34,003ක් බදුකරුගෙන් වර්ෂ 05ක කාලයක සිට අයකර නොගැනීම සම්බන්ධයෙන් අංක 33108 දරන නඩුවේ කටයුතු 2018 වර්ෂයේ සිට කෙරීගෙන යන නමුත් මේ සඳහා වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. | ඉදිරි අනාගතයේ කටයුතු කරනු ලැබේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

-------------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරන වාහන 12ක් අලුත්වැඩියාව සඳහා කටයුතු සිදුකර නොතිබුණි. | අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි අනාගතයේ කටයුතු කරනු ලැබේ. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 09ක් ප්‍රාදේශීය සභාවේ නමට පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගනු ලැබේ. |

**3.5.3 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංචාරක කර්මාන්තය වෙනුවෙන් මනල්කාඩු වෙරළාසන්නයේ 2016 වර්ෂයේ රු.2,805,443ක පිරිවැයකින් ඉදිකර තිබූ වැසිකිළි පද්ධතිය, ඇඳුම් මාරු කිරීමේ කාමරය, වතුර ටැංකිය, කසල බැහැර කිරීමේ ටැංකිය, වෙරළාසන්න ආසන, විකුණුම් සැල් මේ දක්වා භාවිතා කර නොතිබූ අතර, නඩත්තු කරද නොතිබුණි. | සංචාරක කර්මාන්තය නගා සිටුවීමට ඉදිකළ ගොඩනැගිලි භාවිතා කිරීමට කටයුතු කළ යුතු අතර විධිමත් අයුරින් නඩත්තු කිරීමට ද කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු කර ඇත. |

**3.5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික ගබඩා සමීක්ෂණයේදි අයිතමයන් 86ක් සඳහා තථ්‍ය වටිනාකම නොදක්වා සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. | විධිමත් අයුරින් සමීක්ෂණ වාර්තාව සකස් කළ යුතුවේ. | ඉදිරියේදි සමීක්ෂණ වාර්තාව විධිමත් අයුරින් සකස් කරනු ලැබේ. |

## 3.6 ප්‍රසම්පාදනය

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවාවන් සඳහා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 හි සඳහන් | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | මහජන සම්බන්ධිකරණ සංවර්ධන සැලැසුම්,මහජන ඉල්ලීම් ආදිය පිළිබඳ |

| | | |
|---|---|---|
| ආකාරයට සෑම වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලැස්මසකස් කර නොතිබුණි. | | අවධානයට ගෙන කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල, තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීම් ලේඛණය පවත්වාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | මහජන සම්බන්ධිකරණ සංවර්ධන සැලැසුම්,මහජන ඉල්ලීම් ආදිය පිළිබඳ අවධානයට ගෙන කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ප්‍රකාරව කොන්ත්‍රාත් කාර්යයන් සම්බන්ධයෙන් සිදු කරන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර පිටපත් ජාතික විගණන කාර්යාලයට යවා නොතිබුණි. | එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර පිටපත් ජාතික විගණන කාර්යාලයට යැවීමට කටයුතු කළ යුතුවේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් ලෙස ගමන් වියදම්, භාණ්ඩ අවශ්‍යතා සහ මූලධන වත්කම් අලුත්වැඩියා, සහනාධාර හා උපකාරක මුදල්, විශ්‍රාම වැටුප් ආදියෙහි තථ්‍ය වියදම්වල වැඩි ප්‍රතිශතයක් ඉතිරිවීම් පැවැතිණි. මේ නිසා මෙම අයවැය ඇස්තමේන්තුව ඵලදායි නොවූ එකක් ලෙස සැලකුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |